අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும்
அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு

Ministry of Justice, Prison Affairs and
Constitutional Reforms



රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - අංක 183

அரசாங்க கணக்குகள் பற்றிய குழுவின் பாராளுமன்ற வெளியீட்டுத் தொடர் – இல. 183

Series of Parliamentary Publications of the Committee of Public Accounts - No. 183

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்றத்தின் அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் மேற்கொள்ளப்பட்ட நடவடிக்கைகளை பாராளுமன்றத்தில் சமர்ப்பித்தல்

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No.119(4)

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

	අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුවේ නම	ශීර්ෂය
01.	අධිකරණ අමාත්‍යාංශය	110
02.	අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව	228
03.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව	234
04.	ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව	231
05.	ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	233
06.	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	230
07.	නීතිපති දෙපාර්තමේන්තුව	229
08.	නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව	235
09.	බන්ධනාගාර දෙපාර්තමේන්තුව	232
10.	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව	326

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : **අධිකරණ අමාත්‍යාංශය -110**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : **183**

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස : 78.00	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද, අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කර විගණකාධිපති වෙත යොමු කිරීමටත්,වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වන අතිරික්ත, ඌනතා පිළිබඳව නිර්දේශ නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදී.
වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	නියමිත කාල සීමාව තුළ ගර්හිත වාහන අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාල විෂය භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලදී.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට සෑම වාහනයක් සඳහාම ලොග් සටහන් පොත් නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.
2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි 3.1 ඡේදයෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන 10 ක ඉන්ධන දහන පරීක්ෂාවන් මේ වන විට අවසන් කර ඇති අතර 2020 වර්ෂයේ රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් අනෙකුත් වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වැඩ තහනමට ලක්වූ නිලධාරීන්ගේ රු.323,197.00 ක ණය ශේෂ පැවතුනි. • පී.වී. ගුණවර්ධන - රු.162,215.00, නීතිපති දෙපාර්තමේන්තුව මඟින් නඩු පවරා ඇත. • ජී.ඒ.සී. ගමආරච්චි - රු.111,832.00, මෙම නිලධාරියා රජයේ කර්මාන්ත ශාලාවේ නැවත සේවයේ පිහිටුවා ඇතත් මෙතෙක් එම දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කර නොමැති බැවින් ණය ශේෂය අය කර ගැනීමට කිහිප වතාවක් ලියාපදිංචි තැපැල් මඟින් දැනුම් දුන් අතර, ඊට පිළිතුරක් නොලද හෙයින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලිපි මඟින් දැනුම් දී ඇත. • එම්.අයි.ප්‍රනාන්දු - රු.49,150.00, අදාල පුද්ගලයාට ලියාපදිංචි තැපැල් මඟින් දැනුම් දී ඉන් අනතුරුව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මඟින් දැනුම් දී ඇත. කෙසේ නමුත් ණය ශේෂය පියවා නොමැත. ඒ අනුව ණය අයකර ගැනීම සඳහා කෙසෙල්වත්ත පොලිසියේ පැමිණිල්ලක් දමා ඇති අතර මේ වන තෙක් පැමිණිල්ල කැඳවා නැත. සේවය හැර ගිය නිලධාරීන්ගේ රු.243,385.00 ක ණය ශේෂ පැවතුනි. • එච්.එස්.සී.පුෂ්ප කුමාර - රු.121,392.00 සහ එච්.ඒ.ඒ. චාමර - රු. 117,003.00 ණය ශේෂයන් අයකර ගැනීමට නීතිමය පියවර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. • එන්.ජී.ජේ.සී නාරංගස්පිටිය - 2015.06.29 සිට සේවය අතහැර ගොස් සිටින මෙම නිලධාරියාගේ රු.84,290.00ක් වූ ආපදා ණය ශේෂය එම නිලධාරියාගේ ඇපකරුගේ වැටුපෙන් අයකර ගන්නා අතර මේ වන විට රු.79,300.00 ක මුදලක් අයකර ගෙන ඇත. විශ්‍රාම ගිය එන්.පී. ගාල්ලගේ නිලධාරියාගේ රු.350,979.00ක ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිකය සකස් නොකිරීමෙන් අයකර ගැනීමට නොහැකි වී ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි	2020 වර්ෂය වන විට වසර 2 ඉක්මවූ තැන්පතුවක් ලෙස පොදු තැන්පතු ගිණුමේ පැවති UNDP ආයතනයෙන් සමථ දිනය වෙනුවෙන් ලබා දුන් මුදලේ ඉතිරිය වන රු.1,316,040.63ක මුදල 2022.09.01 දින වන විට නිදහස් කිරීමට කටයුතු කර ඇත. මින් ඉදිරියට එවැනි වසර 2 ඉක්මවූ තැන්පතු පවතී නම් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්යසාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම කාලය තුළ රට තුළ උද්ගතව පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත රට හුදකලා කිරීම හා නිලධාරීන් සේවයට කැඳවීම සීමා කිරීම හේතුවෙන් කාර්ය සාධන වාර්තා සකස් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම සඳහා දීර්ඝ කාලයක් ගත විය. කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට අවශ්‍ය සම්පූර්ණ තොරතුරු ලද පසු එම වාර්තාව මුද්‍රණය කර 2021.12.03 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

දෙවැනි කොටස : 64.00	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මේ වන විට මහජනයාට අමාත්‍යාංශයේ වෙබ් අඩවියට පිවිස පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව ලබා දී ඇත.
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිලියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කිරීමට කටයුතු සිදු කරමින් පවති. එය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රම වේදයක් සකස් කරන අතර ඉදිරියේදී එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලැබේ.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිලිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් සැලසුම්ගත පුහුණු අවස්ථා ලබා දීමට හැකියාවක් නොමැති වී ඇති අතර මේ වනවිට සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු/ දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි. හඳුනාගත් පළමු කාර්යසාධක දර්ශකයේ ලඟාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.</u>

ආයතනයේ නම හා ශීර්ෂය **: අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව - 228**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය **: 183**

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	**එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
<u>පළමු කොටස : 68.00</u>	
හානි පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත	වර්තමානයේ හානි පිළිබඳව ලේඛණයක් යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා ඉදිරියේ දී ප්‍රමාදයකින් තොරව පිළිතුරු යැවීමට කටයුතු කරනු ලැබේ.
2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට සිදු කර අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට ද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද, අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	2020 වර්ෂයට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශයේ ගැලපුම් කළ යුතුව පැවති ශේෂ මේ වන විට නිරවුල් කර ඇති අතර බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව ජනිත වන ගැලපුම් කළ යුතු ශේෂ සම්බන්ධයෙන් අදාල මාසය තුළ ම නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි.	මු.රෙ.94(2) ප්‍රතිපාදනයන්ට යටත්ව පුනරාවර්තන ස්වභාවයේ වියදම් වෙනුවෙන් පසුගිය වර්ෂ 3ක සාමාන්‍යයෙන් 50% දක්වා බැරකම් වලට එලඹීමේ හැකියාව පවතින බැවින් අධිකරණවල දෛනික කටයුතු පවත්වා ගැනීමේ අරමුණින් බැඳීම් ඇති කර ගෙන ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතිණි.	වර්ෂ ගණනාවක සිට අය නොවී පවතින ණය ශේෂ ඇපකරුවන්ගෙන් හා ඇතැම් පුද්ගලයින්ගෙන් වාරික වශයෙන් අය වෙමින් පවතී. අය නොවී පවතින ණය ශේෂ සම්බන්ධයෙන් කමිටුවක් පත් කර ගෙන ඇති අතර එහිදි ණය ශේෂ අය කර ගැනීම සම්බන්ධයෙන් විකල්ප යෝජනා ඉදිරිපත් වී ඇත. ඒ අනුව මේ වන විට මහාධිකරණ විසින් මාසිකව ප්‍රගතිය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරේ. මේ සම්බන්ධව දැනටමත් විශේෂ

	අවධානයක් යොමු කර ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. තවද, 2022 වර්ෂයට අදාළව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020ට අනුව 25,000.00 අඩු ණය ශේෂ රු.159,841.75ක මුදලක් මු.රෙ.113 යටතේ කපා හැර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු ලෙස පවතිනුයේ ඉදිකිරීම් වලට අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ රැඳවුම් මුදල් හා නඩු කටයුතු වලට අදාල ඇප තැන්පත් වේ. වසර 02ට වඩා අධික කාලයක් ක්‍රියාත්මක වන ඉදිකිරීම් වලට අදාල රැඳවුම් මුදල් අදාල ඉදිකිරීම අවසන් වන තෙක් රඳවා තබා ගත යුතු බැවින් එම තැන්පතු වසර 02 ඉක්මවුවද තැන්පත් ගිණුමේ රඳවා තබා ගත යුතුව ඇත. එමෙන්ම විදේශ සිතාසි වෙනුවෙන් වන තැන්පතු ශේෂ සඳහා අධිකරණ නියෝගයක් ලැබෙන තෙක් රඳවා තබා ගැනීමට සිදුවේ. එසේම අධිකරණයන්හි පවතින වසර 02ට වඩා කල් ඉකුත් වූ තැන්පතු නඩු කටයුතු වලට අදාල ඇප තැන්පත් වන බැවින් නඩු කටයුතු අවසන් වන තෙක් රඳවා තබා ගතයුතු වේ.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය සාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර එය 2021 දෙසැම්බර් මස පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.
2017.09.20 දිනැති 2017 අංක 04 දරණ කලමණාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්යය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කලමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර නොතිබුණි.	අධිකරණ පරිපාලනයට අයත් උපලේඛන ගත තනතුරු අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් පාලනය වන අතර උපලේඛන ගත නොවන තනතුරු අධිකරණ අමාත්‍යාංශය මගින් පාලනය වේ.අධිකරණ අමාත්‍යාංශය මගින් පාලනය වන උපලේඛණ ගත නොවන තනතුරු වල අදාල කාර්ය මණ්ඩල තොරතුරු මේ වනවිටත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. 2017.09.20 දිනැති 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ කොමිෂන් සභා ආමන්ත්‍රණය නොවීම හේතුවෙන් උපලේඛන ගත තනතුරු වලට අදාල තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැති බව නිරීක්ෂණය වී ඇත. එබැවින් අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

දෙවැනි කොටස : 54.00	
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කොට වෙබ් අඩවියේ සහ පුරවැසි/සේවා ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනු ඇත.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් සැලසුම්ගත පුහුණු අවස්ථා ලබා දීමට හැකියාවක් නොතිබූ අතර ඉදිරියේ දී සියළුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරනු ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් ගතව නොතිබුණි.	
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි	
සැලසුම්ගත පුහුණු අවස්ථාව වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : **ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව - 234**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : **183**

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස : 79.00	
මු.රෙ. 134(2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොමැති අතර, අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය මගින් එම කටයුතු සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අභ්‍යන්තර විගණන වාර්තාවන් ඉදිරිපත් කරන අවස්ථාවේ දී අදාල පිටපත් විගණකාධිපති වෙත යොමු කරන අතර 2020 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා 2022 වර්ෂයේ සිට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු සලසා ඇත.
වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත තත්ත්වයේ පැවති වාහන 04ක් අධිකරණ අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය වෙත පවරා දෙන ලදී.
සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට පැවත එමින් තිබූ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර නොතිබුණි.	ලංකා බැංකුවේ අංක 1370724 දරණ ගිණුම නිරවුල් කර වසා දමා ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	2020 වර්ෂයට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ශේෂ සියල්ල නිරවුල් කර ඇත.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවෙන් ඉක්මවා බැඳීම් ඇති කර ගෙන තිබුණි.	ඉදිරියේ දී පවතින ප්‍රතිපාදන සීමාව මත පමණක් බැඳීම් ඇති කර ගැනීමට උපදෙස් ලබාදෙන ලදී.
පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මෙයින් බහුතරය මුලික අයිතිවාසිකම් නඩුවලට අදාල වන්දි මුදල් වන අතර, නඩු ගොනු පරීක්ෂා කර බලා අදාල පාර්ශවයන්ට ගෙවීම හෝ රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතී.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රීම කාර්යය නිමවූ වහාම නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.</u>

සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතු කාර්යය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2020 හා 2021 වර්ෂවල පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ නියමිත දිනට අවසන් කිරීමට නොහැකි වූ නමුත් එම වාර්තාව 2022 ජුනි මස වනවිට අවසන්කර 2022 ඔක්තෝබර් මස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
<u>දෙවැනි කොටස : 23.00</u>	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙබ් අඩවිය මගින් දුරකථන අංකය සහ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ධූරය සඳහා අදාල විද්‍යුත් තැපැල් ලිපිනය මහජනතාව වෙත දන්වා ඇත. මෙම ආයතනය රටේ උත්තරීතර අධිකරණය වන බැවින් එම උත්තරීතර අධිකරණයේ කටයුතු සම්බන්ධව වෙබ් අඩවියට පිවිසෙන සෑම අයෙකුටම දැක ගත හැකි වන පරිදි වෙබ් අඩවියේ අදහස් ප්‍රකාශ කිරීම ආයතනයේ ගරුත්වයට හා ක්‍රියාකාරිත්වයට හානි කර බැවින් ප්‍රසිද්ධ අදහස් දැක්වීම සඳහා අවස්ථාවක් සකස් කර නොමැත. ඒ සඳහා ඉහත සඳහන් පරිදි විද්‍යුත් ලිපිනය හා දුරකථන අංක වෙබ් අඩවිය මගින් සපයා ඇත.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	2023 වර්ෂයේ සිට ආයතනයේ විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන එම අරමුණු ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.
හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලගා කර ගැනීම මැන බැලීම සඳහා කාර්යය සාධන ඉලක්ක නියම කර නොතිබුණි.	
ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලගා කර ගැනීමට අදාල වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි.	
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍ර ලේඛ විධි විධාන අනුව ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිලිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිලියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර ඇත.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිලිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්ම පිළියෙල කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	අනුමත ප්‍රතිපාදන මත පැය 12ක පුහුණු අවස්ථා ලබාදීමේ හැකියාවක් නොතිබුණි. තවද ලඝුලේඛක, යතුරු ලේඛක, ලිපිකරු ,සංවර්ධන නිලධාරී පත්කරනු ලබන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් වන බැවින් එමගින් ද පුහුණු කටයුතු සංවිධානය කරනු ලබයි.
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	2022 වර්ෂය සඳහා කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව ඇත.
මානව සම්පත් සැලැස්ම සකස් කිරීම ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මේ වන විට මානව සම්පත් සැලැස්ම සකස් කිරීමට හා ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නිලධාරීන් දෙදෙනෙකු නම් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාව වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	
අයවැය චක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමැවුම් දර්ශක තුනක් හඳුනාගෙන ලේඛනගතකර නොතිබුණි.	ඉටු කරනු ලබන කාර්යභාරය සම්බන්ධව නිමවුම් දර්ශක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.
ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්ය භාර්ය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	
හඳුනාගත් පළමු කාර්ය සාධක දර්ශකයේ ලභාවීම 50% ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	
හඳුනාගත් දෙවන කාර්ය සාධක දර්ශකයේ ලභාවීම 50% ට වඩා අඩු මට්ටමක විය.	
හඳුනාගත් තුන්වන කාර්ය සාධක දර්ශකයේ ලභාවීම 50% ට වඩා අඩු මට්ටමක විය.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : **ණය සහනදායී මණ්ඩලීය දෙපාර්තමේන්තුව - 231**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : **183**

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස : 71.00	
ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම අවම කරමින් නිලධාරීන් දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ දැනට අනුමත මාණ්ඩලික තනතුරු ලෙස පවතින්නේ දෙපාර්තමේන්තු ලේකම් සහ ගණකාධිකාරී තනතුර පමණි. ඒ හේතුවෙන් මු.රෙ. 135, යටතේ බලතල පැවරීමේ දී දෙදෙනෙකුගේ පරීක්ෂාවට ලක් වන පරිදි බලතල පැවරීම සිදු කර ඇත .එබැවින් බලය දීම හා අනුමැතිය ලබා දීම එක් නිලධාරියෙකුටද, සහතික කිරීම හා ගෙවීම එක් නිලධාරියෙකුට පවරා ඇත.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතය ආරම්භ කර ඇති අතර උපදෙස් දී ඇති පරිදි වැටුප් මෘදුකාංගයේ මුරපදවල අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ණය සහනදායී මණ්ඩලීය දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොමැති අතර, අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය මගින් එම කටයුතු සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අභ්‍යන්තර විගණන වාර්තාවන් ඉදිරිපත් කරන අවස්ථාවේ දී අදාල පිටපත් විගණකාධිපති වෙත යොමු කරන අතර 2020 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත.
මු. රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

2017.06.26 දිනැති අංක 1/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්පට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු අදාල කාලය තුල කොම්පට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික වාර්තා විගණකාධිපති වෙත යැවීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.
වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි	300-5479 මෝටර් රථය මේ වනවිට පොලිස් ප්‍රවාහන කොට්ඨාසය වෙත භාවිතය වෙනුවෙන් යවා ඇත.
සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වාගෙන ගොස් නොතිබුණි. 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගෙන යාමටත් ඉන්ධන දහනය පිලිබඳව පරීක්ෂාවන් සිදු කිරීමටත් කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලැබේ.
මු.රෙ. 94(1) ප්‍රකාරව වැය විෂයට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැදීම් ඇති කර ගෙන තිබුණි.	ඉදිරියේ දී මෙවැනි දෝෂ සිදු නොවීමට කටයුතු කරනු ලැබේ.
මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රීම කාර්ය නිමවූ විගස නිරවුල් කිරීමට කටයුතු කලයුතු බව අදාල නිලධාරින් දැනුවත් කරන ලදි. මේ වනවිටත් එය ක්‍රියාත්මක වේ.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේ දි නියමිත දිනට කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.</u>

<u>දෙවැනි කොටස : 21.00</u>	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මහජනතාවට පැමිණිලි හා ප්‍රශංසා සටහන් කිරීමට හැකි වන අයුරින් මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	2018/04/27 දිනැති අංක MSDW/08/65 චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ග කළමනාකරණ සැලැස්මට අනුව ආයතනිකව, පළාත් හා ජාතික මට්ටමින් ලභා කර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.
හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලගාකර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි.	
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිලිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිලියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට මෙම වර්ෂයේ සිට අදාල කටයුතු කරනු ලැබේ.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිලිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව ඉදිරියේදී මානව සම්පත් සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරන ලෙස අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	

මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තුබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	
අයවැය චක්‍රලේඛය අනුව අවම වශයෙන් නිමවුම් දර්ශක 3ක් හඳුනාගෙන ලේඛන ගත කර නොතිබුණි.	මෙ වන විට නිමවුම් දර්ශක 03ක් හඳුනාගෙන ඇති අතර එම දර්ශක සඳහා ළඟා වීමේ මට්ටමට ඉහල නංවා ගැනීමට අදාල කටයුතු කරනු ලැබේ.
ආයතනය විසින් ඉටුකරනු ලබන කාර්යභාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	
හඳුනාගත් පළමු කාර්යසාධන දර්ශකයේ ලගාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	
හඳුනාගත් දෙවන කාර්යසාධක දර්ශකයේ ලගාවීම 50%ට වඩා අඩු මට්ටමක විය.	
හඳුනාගත් තුන්වන කාර්යසාධන දර්ශකයේ ලගාවීම 50%ට වඩා අඩු මට්ටමක විය.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය **: රස පරීක්ෂක දෙපාර්තමේන්තුව - 233**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය **: 183**

කම්ටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස : 82.00	
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	රටේ පැවැති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් 2020 වසරට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ අතර 2021.10.22 දින භාණ්ඩ වෙන්දේසිය පවත්වා කටයුතු අවසන් කරන ලදී.
2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව ආයතනය සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර නොතිබුණි.	2020 වර්ෂය වෙනුවෙන් වාහන වල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂණ කටයුතු 2021.12.15 වන විට සිදුකර ඇත.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකරගෙන තිබුණි.	බැදීම් හා බැරකම් ප්‍රකාශය මු. රෙ 94 (11) ප්‍රතිපාදන යටතේ එළඹෙන ලද බැදීම් ද ඇතුළත් කොට සකස් කර තිබුණි.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වැඩ තහනමට ලක්වී ඇති නිලධාරීන් සම්බන්ධයෙන් වන නඩු කටයුත්ත මේ වන තෙක් අවසන් වී නොමැත. සේවය හැර ගොස් ඇති නිලධාරියාගේ ණය ශේෂය වන රු. 62,549.00 මේ වන විට නිරවුල් කර ඇත.
පොදු තැන්පත් ගිණුමේ කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු. රෙ 571 ප්‍රකාරව මේ වන විට කටයුතු සිදු කර ඇත.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	රටේ පැවැති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූ අතර 2021.11.29 දින ඉදිරිපත් කර ඇත.
2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	2023 වර්ෂයේ සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කාර්ය මණ්ඩල තොරතුරු කාර්තු වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබාදී ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

දෙවැනි කොටස : 74.00	
ඉල්ලා සිටිනු ලබන තොරතුරු ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛණගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛණ පවත්වා නොතිබුණි.	ඉල්ලා සිටින තොරතුරු ලබා නොදීම සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග වාර්තා ගත කර තොරතුරු ලබාදීමේ කටයුතු වල තත්ත්වය යාවත්කාලීන කර ගැනීමේ ලේඛනයක් 2023.02.01 දින සිට පවත්වා ගෙන යාමට පියවර ගෙන ඇත.
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍ර ලේඛ විධි විධාන අනුව ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිලිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා නියෝජිතයින් දෙදෙනකු නම් කර යැවීමට කටයුතු කර ගෙන යනු ලැබේ.
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	2022/2023 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇති අතර පැවැති ප්‍රතිපාදන යටතේ කාර්ය මණ්ඩලයේ 75%කට පමණ පුහුණු ලබා දී තිබුණි. සමස්ත කාර්ය මණ්ඩලයම ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කරමින් පවතී.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි	
සැලසුම් සහගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : **නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව - 230**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : **183**

කම්ටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස : 86.00	
2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට 2020 සහ 2021 වර්ෂ වල භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර අදාළ නිර්දේශ ද ක්‍රියාත්මක කර අවසන් කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	
ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා වියදම් දැරීම සිදුව තිබුණි.	බැරකම් හා බැඳීම් සම්බන්ධයෙන් මු.රෙ.94(1) ප්‍රකාරව ඉදිරියට කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයට සලසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු ඉතිරිවූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇතිකර ගෙන තිබුණි.	
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2021 වර්ෂයේ සිට කාර්ය සාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුව වෙත යවා ඇත.
2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	2021 වර්ෂයේ සිට නිසි ලෙස යාවත්කාලීන කරන ලද කාර්ය මණ්ඩල තොරතුරු 2017 අංක 4 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවක් අවසානයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

දෙවැනි කොටස: 74.00	
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම සඳහා සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් දෙදෙනෙකු පත් කර ඇති අතර, අවශ්‍ය වාර්තා සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලගා කර ගැනීම මැන බැලීම සඳහා කාර්යය සාධන ඉලක්ක නියම කර නොතිබුණි.	
ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලගා කර ගැනීමට අදාල වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි.	
පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	රා.ප.ව. 05/2008 න් හඳුන්වා දී ඇති පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සැකසීමේ මාර්ගෝපදේශ ඇතුළත් ඇමුණුම (අ) හි සඳහන් පරිදි පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය යනු මහජනතාවට සේවාවන් ලබා ගැනීමට ඇති අයිතිය පිළිබඳව වන ලිඛිත බැඳීමක් වන අතර, මහජන සහභාගීත්වය ඒ සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය නිර්මාණය වී ඇත්තේ මහජනතාව වෙනුවෙන් සේවය කිරීම නොව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන නීති සම්පාදනය සඳහා වන බැවින් පුරවැසි ප්‍රඥප්තිය යන සංකල්පය මෙම දෙපාර්තමේන්තුව සඳහා යොදා ගැනීමේ ප්‍රායෝගික තත්වයක් නොමැත. නමුත් විමසීම් සඳහා පිළිතුරු සැපයීමේ අවශ්‍යතාවය මත අභ්‍යන්තර පාලන කටයුතුවල දී අනුගමනය කෙරෙන ක්‍රියා මාර්ග අළලා පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර ඇත. එය අදාළ වන්නේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත සේවා සැපයීම හා දෙපාර්තමේන්තුව තුල සිදු වන නීති සම්පාදන ක්‍රියාවලිය සඳහා පමණි.
ආයතනයේ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිලිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුල ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	
සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුලත්ව කාර්යය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයම ඇතුලත් කර කාර්ය සාධන ගිවිසුමක් සකස් කර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව 2022 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.
මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතන තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	
සැලසුම්ගත පුහුණු අවස්ථාව වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : **නීතිපති දෙපාර්තමේන්තුව - 229**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : **183**

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස: 67.00	
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි	2020 වර්ෂයට අදාලව විගණකාධිපති විගණන විමසුම් 03ක් ලැබී ඇති අතර එම විගණන විමසුම් 03 සඳහා මසක් ඇතුලත පිළිතුරු යවා ඇත. මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතියෙහිද එය නිවැරදි ලෙස සටහන් කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයේදී ඇති වූ කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්යාල වසා තැබීම නිසා විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම තරමක් ප්‍රමාද වූ අතර එම වර්ෂය තුල ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් එවා තිබූ සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු යවා අවසන් කර ඇත. විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීමේ ප්‍රමාදයන් මග හරවා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.
මු.රෙ.134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයේ සකස් කරන ලද සියළුම විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතියෙහිද එය නිවැරදි ලෙස සටහන් කර ඇත.
2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයේ රටෙහි ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය මත පිට පළාත් කාර්යාලයන්හි භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාලය තුළ සිදු කල නොහැකි වූ අතර වරින් වර කාර්යාල වසා තැබීම නිසා භාණ්ඩ සමීක්ෂණයෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමද ප්‍රමාද වීම මත භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. ඉදිරියේදී එවැනි ප්‍රමාදයන් මග හරවා ගැනීමට කටයුතු කරන බව දන්වමි.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිලිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	

2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ආයතනය සතු වාහන ඉන්ධන දහනය වීම පිළිබඳව පරීක්ෂාවන් කර නොතිබුණි.	වාහනවල ඉන්ධන දහනය වීම පිළබඳ පරීක්ෂාවන් නිසියාකාරව සිදු කරනු ලබන අතර 2020 වර්ෂයේ රටෙහි ඇති වූ කොවිඩ් වසංගත තත්ත්වය මත වාහන කිහිපයක ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කල නොහැකි විය.ඉදිරියේදී එවැනි තත්වයන් පාලනය කර ගනිමින් කටයුතු කරනු ලැබේ.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුමෙන් අනාවරණය වන ගැලපුම් මසක් තුළ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදී.
මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව අනුමත සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කරගෙන තිබුණි.	2020 වර්ෂය සඳහා අත්‍යවශ්‍ය සේවාවන් සපයා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබුනද, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබුන අතර රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය සේවාවන් සපයා ගැනීම වෙනුවෙන් බැරකම්වලට එළඹීමට සිදු විය. ඉදිරියේදී ප්‍රමාණවත් ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමටත්, පවතින ප්‍රතිපාදන කළමනාකරණය කර ගැනීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත. • වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් අය කර ගත යුතුව තිබූ රු.183,560.00 ක මුදලින් රු. 15,000.00 ක මුදලක් අය කර ගෙන ඇති අතර ජේ.ඩී.ප්‍රේමසිරි යන අයගේ ණය ශේෂ වාරික වශයෙන් අය කර ගනිමින් පවතී. • සේවය හැරගිය නිලධාරින්ගෙන් අයවිය යුතුව තිබූ රු.1,788,263,.98 ක ණය ශේෂයෙන් ටී.ඩබ්.කරුණාරත්න මහතාගේ රු.743,315.00 ක ණය ශේෂය අයකර ගැනීම සඳහා නඩු පැවරීමට කටයුතු කර ඇත. ඉතිරි ණය ශේෂයන්ගෙන් රු.430,406.98ක මුදලක් අය කර ගෙන ඇත. අනෙකුත් ණය ශේෂයන් අය කර ගැනීමට හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් ප්‍රකාරව අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර ඉදිරි කාර්සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

දෙවැනි කොටස: 60.00	
ආයතනයේ තම විෂය පථය අනුව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලහා කර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි. ආයතනයේ තිරසර අරමුණු ඉලක්ක ලහා කර ගැනීමට අදාළ වන නිශ්චිත පාර්ශව හඳුනාගෙන නොතිබුණි.	තිරසර සංවර්ධන සභාව මඟින් නිශ්චය කර ඇති ආකාරයට තිරසර අරමුණ හඳුනාගෙන ඇත.
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත් කළ නියෝජිතයින් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු නම් කිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී.
පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	ශ්‍රී ලංකාවේ සියළු ශ්‍රී ලාංකික පුරවැසියන් වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වය ඉෂ්ඨ කිරීම සඳහා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලියෙහි ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයක් ලෙස අඛණ්ඩවම ක්‍රියා කරනු ලබයි.
ආයතනයේ පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිලියෙල කර නොතිබුණි.	2020 වර්ෂයේ දී කොවිඩ් - 19 වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ පුහුණු වැඩසටහන් සැලසුම් කල පරිදි නොපැවැත්වුණු අතර, 2023 වර්ෂය සඳහා මෙම වර්ෂයට වෙන් කර ඇති සීමිත ප්‍රතිපාදන භාවිතා කරමින් සමස්ත කාර්යය මණ්ඩලය සඳහා සැලසුමකට අනුව පුහුණු ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	
සැලසුම්ගත පුහුණු අවස්ථාව වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : **ශ්‍රී ලංකා නීති කොමිෂන් සභාව - 235**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 183

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස:91.00	
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසර ලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව තුළ වැටුප් සැකසීම 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතයෙන් සිදු නොවේ.
2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාල පලමු, දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	
2016.12.29 දිනැති අංක 5/2016/30 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සම්ක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020 වසරේ සිට උද්ගත වූ කොවිඩ් ව්‍යසනය, දේශපාලන ව්‍යාකූලත්වය,ආර්ථික පසුබෑම හා ඉන්ධන අර්බුදය ආදී කරුණු හේතුවෙන් 2020 වසරෙන් පසු මේ දක්වා ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කිරීමට ප්‍රායෝගිකව දුෂ්කරතා මතු වූ අතර දැනට නියම වී ඇති ඉන්ධන කෝටාව පූර්ණ ලෙස ඉන්ධන දහන පරීක්ෂාවක් සඳහා ප්‍රමාණවත් නොවන බැවින් එම තත්ත්වයන් යථා තත්ත්වයට පත් වූ පසු නිසි පරිදි ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි.	මෙම කාලය තුළ රට තුළ අද්ගතව පැවති කොවිඩ් ව්‍යවසනය හේතුවෙන් නියමිත දිනයට කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර 2021.10.01 දින කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

දෙවැනි කොටස: 52.00	
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍ර ලේඛ විධි විධාන අනුව ඉටුකල යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කල යුතු නියෝජිතයන් දෙදෙනා පිලිබඳ විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි.	තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා නිලධාරීන් දෙදෙනෙකු නම් කිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වහයෙන් වර්ෂයකට පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	කොවිඩ් ව්‍යසනය හේතුවෙන් උද්ගත වූ තත්ත්වය නිසා සියලු පුහුණු අවස්ථා අත්හිටු වීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත විය.
ආයතනය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය හා සම්බන්ධිතව ප්‍රධාන කාර්ය දර්ශක 03ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය සම්බන්ධව කාර්ය සාධන දර්ශක හඳුනාගෙන එම දර්ශක සඳහා ලභා වීමේ මට්ටමට ඉහල නංවා ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී.
හඳුනාගත් පළමු කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	
හඳුනාගත් දෙවන කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50%ට වඩා අඩු මට්ටමක විය.	
හඳුනාගත් තුන්වන කාර්යසාධක දර්ශකයේ ලභාවීම 50%ට වඩා අඩු මට්ටමක විය.	

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : - **බන්ධනාගාර දෙපාර්තමේන්තුව 232**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 183

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
	පළමු කොටස:62.00
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2020 සහ 2021 වර්ෂයන්ට අදාලව ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විට යාවත්කාලීන කොට ඇත. 2022 වර්ෂය සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කෙරෙමින් පවතී.
හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	හානි පිළිබඳ ලේඛණයක් පවත්වාගෙන යනු ලබන අතර මේ දක්වා හානි සම්බන්ධයෙන් මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග වලට අදාලව එය යාවත්කාලීන කර ඇත
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණන විමසුම් වෙනුවෙන් පිළිතුරු ලබා දීම වෙනුවෙන් බන්ධනාගාර මූලස්ථානයේ අංශ හා බන්ධනාගාර උප ආයතන 29 ක් වෙතින් පිළිතුරු කැඳවා ගැනීම සිදු කර පසුව එම පිළිතුරු අනුව විගණන විමසුම් සඳහා පිළිතුරු සකස් කරනු ලබයි. එහිදී අංශ හෝ ආයතන වෙතින් ලබාදෙන පිළිතුරු ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී නැවත නැවතත් පිළිතුරු කැඳවීම සිදුකර අවසාන පිළිතුරක් සකස් කරන බැවින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමේදී ප්‍රමාදයන් සිදු වී ඇත. එහෙත් මේ වන විට නිසි කාල වකවානුව තුල පිළිතුරු ලබා දීමට කටයුතු කර ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු සපයා නොතිබුණි.	2020 වර්ෂය තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතු කොට ගෙන පැවති සංචරණ සීමා හේතුවෙන් නිලධාරී සේවයට වාර්තා කිරීමේ දී පැවති දුෂ්කරතා මත පිළිතුරු සැපයීම ප්‍රමාද වූවත් මේ වන විට අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දිමට කටයුතු කර ඇත.
විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2 ක් වත් පවත්වා නොතිබුණි.	2020 වර්ෂය තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය මත ඒකරාශී වීම් සිදු කල නොහැකි වූ බැවින් රැස්වීම් පැවැත්වීම සීමා සහිත වූ අතර 2020 වර්ෂයේ රැස්වීම් 02 ක් පවත්වා ඇත.
2017.06.26 දිනැති අංක 1/2017 දරණ වත්කම් කළමණාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදි ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්පට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	උක්ත චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂයට අදාලව ඉඩම්, ගොඩනැගිලි, ඉදිකිරීම්, වාහන, යන්ත්‍රෝපකරණ හා පිරියත සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ වලට අදාළ යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් වූ සියළු යාවත්කාලීන කිරීම් සිදුකර මෘදු පිටපත් මඟින් කොම්පට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ විද්‍යුත් ලිපිනය වෙත යොමු කර ඇත.

<u>රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ</u>

<u>මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.</u>

2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳ වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුල ක්‍රියාත්මක කර නොතිබුණි.	2020 සහ 2021 වර්ෂන්ට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර අවසන් කර ඇති අතර අනාවරණය වූ අතිරික්තතා, ඌණතාපිළිබඳව නිර්දේශ ද මේ වන විට ක්‍රියාත්මක කර ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2020 ට **අදාල** සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා 2021 වර්ෂය තුලදී විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති බවත්, ඉදිරියේ දී නිසි කාලයට අනුව දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
වාහනයක් ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	දිවයින පුරා බන්ධනාගාර උප ආයතන 31 ක් පවතින අතර එම ආයතන මඟින් භාවිතයෙන් ඉවත් කළ බව දන්වනු ලබන වාහන, අදාළ ආයතන වෙත ගොස් පරීක්ෂා කිරීම සඳහා මණ්ඩලයක් පත් කර කටයුතු කළ යුතු බැවින් එම නිළධාරීන්ගේ රාජකාරී වල කාර්ය බහුලත්වය මත වාහන අපහරණ කටයුතු වල යම් ප්‍රමාදයක් සිදුව ඇති නමුත් 2020 වර්ෂයේ කටයුතු කරමින් පැවති සියළු ගර්හිත වාහන මේ වන විට අපහරණය කර අවසන් කර ඇති අතර ඉදිරියේදී මෙවැනි ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ, ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වන ගැලපුම් කළ යුතු ශේෂ මසක් තුළ නිරවුල් කිරීමට කිරීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	හිඟ ණය ශේෂ අය කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සියළුම බන්ධනාගාර ආයතන දැනුවත් කිරීම සඳහා දෙපාර්තමේන්තු චක්‍රලේඛ නිකුත් කිරීම, ගිණුම් කටයුතු සිදු කරනු ලබන නිළධාරීන් කැඳවා බී ගිණුමේ කටයුතු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීමට පුහුණු වැඩමුළුවක් පැවැත්වීම, සේවය හැර ගිය, සේවයෙන් පහ කළ හා වැඩ තහනම් කළ හිඟ ණය පවතින නිළධාරීන් ප්‍රාදේශීය ලේකම් මඟින්, ග්‍රාම නිළධාරී මඟින් සහ පොලිසිය මඟින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. එලෙස ක්‍රියාමාර්ග ගන්නා ලද නිළධාරීන් 03ක් මේ වන විට මාසික වාරික වශයෙන් හිඟ ණය ගෙවීමට කටයුතු කරමින් පවතී. 2021.12.31 දින වන විට වර්ෂය ඉක්ම වූ හිඟ ණය ලෙස රු.7,508,064.94 ක ශේෂයක් පවතියි.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

පොදු තැන්පත් ගිණුම් කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුම යටතේ ක්‍රියාත්මක වන මුද්දර ගාස්තු තැන්පතු (18/75), ටෙන්ඩර් තැන්පතු (2/17), තෙවන පාර්ශවයන් සඳහා වන තැන්පතු (13/125) යන ගිණුම් 03 ට අදාල වසර 02 ඉක්ම වූ ශේෂ සම්බන්ධව අදාල අංශ හා බන්ධනාගාර ආයතන දැනුවත් කර රජයේ ආදායමට බැර කිරීමට මේ වන විට කටයුතු කර ඇති බවත්, සිර චේතන තැන්පතු (6/81) සම්බන්ධයෙන් සිරකරු නිදහස් වී වසරක් ඉක්මව ඇතත් ඉල්ලීමක් නොකල ඇති තැන්පතු සිරකරු සුභසාධක අරමුදලටත් (6/28) බැර කිරීමට කටයුතු කර ඇත. තවද, නිලධාරී ඇප තැන්පතු (1/16) වෙනුවෙන් බැංකු ගිණුම් විවෘත කිරීමට හා කොන්ත්‍රාත් තැන්පතු (16/62) සම්බන්ධව අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් අදාල අංශ දැනුවත් කර ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් සිදු කරනු ලැබේ.
මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	2020 වර්ෂය තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතු කොට ගෙන පැවති සංචරණ සීමා හේතුවෙන් නිලධාරී සේවයට වාර්තා කිරීමේ දී පැවති දුෂ්කරතා මත මෙලස ප්‍රමාද වූවත් 2021 අප්‍රේල් මස ගිණුම් සාරාංශය මඟින් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. අතුරු අග්‍රිම කාර්යය නිම වී මාසයක් ඇතුලත නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
රැස්කර නිබුණු ආදායම් නියමිත කාලය තුල නියමානුකූල ලෙස බැහැර කර නොතිබුණි**.**	2020 වර්ෂය තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතු කොට ගෙන පැවති විවිධ සීමා හේතුවෙන් රැස්කර තිබුණු ආදායම් නියමිත කාලය තුල ගිණුම් තැබීම් සිදු කිරීමට නොහැකි විය. 2021 වර්ෂය තුලදී එම ආදායම් නියමිත පරිදි ගිණුම් ගත කර රජයේ ආදායමට බැර කල යුතු මුදල් බැර කරීමට කටයුතු කර ඇත
2017.09.20 දිනැති 2017 අංක 04 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	කොරෝනා වසංගතය හේතුවෙන් කාර්ය මණ්ඩලය කැඳවීම සීමා කිරීම නිසා 2020.01.01 දින සිට 2020.06.30 දක්වා කාර්ය මණ්ඩල තොරතුරු 2020.07.22 දින යොමු කර ඇත. තෙවන හා සිව්වන කාර්තු නියමිත පරිදි යොමු කර ඇත.

දෙවැනි කොටස : 56.00	
පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කර නොතිබුණි.	ඉදිරියේදී මෙම පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී එය අධීක්ෂණය හා ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමේ කටයුතු අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.ආ) විසින් අවධානය යොමු කර කටයුතු කරමින් පවතියි. මේ වන විට පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත.
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කර ගෙන ඇති අතර කොරෝනා වසංගතය හේතුවෙන් කාර්ය මණ්ඩලය සීමා කිරීම නිසා ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී ඇත. මේ වන විට මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12 ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අදාල පුහුණු කටයුතු සිදු කරන පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය මඟින් සෑම වර්ෂයක් සඳහාම පුහුණු පාඨමාලාවන් සැලසුම් කරනු ලැබේ. නවක නිලධාරී පුහුණුව, අභ්‍යන්තර උසස් වීම් ලද නිලධාරී පුහුණුව, සේවාස්ථ පුහුණුව, අවස්ථානුකූල බාහිර පුහුණුව, අවි පුහුණුව පුහුණු උපාය මාර්ග ලෙස දැක්වෙන අතර නවක නිලධාරී පුහුණුව, අභ්‍යන්තර උසස් වීම් ලද නිලධාරී පුහුණු වැඩමුළු දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා පැවැත්වේ. පුහුණු පාඨමාලාවන් සැලසුම් කිරීමේ දී නිලධාරීන් හට අවශ්‍ය පුහුණු අවශ්‍යතාවයන් බන්ධනාගාර අධිකාරී වරුන් හරහා හඳුනා ගෙන ඒ අනුව එයින් ප්‍රමුඛතාවය ලබා දිය යුතු පුහුණු පාඨමාලාවන් අදාල වර්ෂය තුල පැවැත් වීම සඳහා සැලසුම් කරනු ලැබේ.
සමස්ථ කාර්ය මණ්ඩලය ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 02 හි දැක්වෙන ආකෘතිය මත පදනම් නොවූ නමුත් මෙම දෙපාර්තමේන්තුවේ සෑම නිලධාරියෙකු විසින්ම වාර්ෂිකව කාර්ය සාධන ඇගයීම් වාර්තා සම්පූර්ණ කිරීම සිදු කෙරෙන අතර ප්‍රධාන ජේලර් හා ඊට ඉහළ තනතුරුවල නිලධාරීන් විසින් වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් ක්‍රමවේදය භාවිත කරයි. එම කටයුතු මෙම චක්‍රලේඛයෙහි සඳහන් ආකාරයට වඩාත් අර්ථ පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.ආ) විසින් අවධානය යොමු කර කටයුතු කරමින් පවතී.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ආයතන තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	දෙපාර්තමේන්තුවට අදාළ පුහුණු කටයුතු සිදුකරන පර්යේෂණ හා විශෝධන පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (පුහුණු) ලෙස බන්ධනාගාර අධිකාරිවරයකු කටයුතු කරනු ලැබේ.
විගණකාධිපතිවරයා විසින් ඡේදවලින් පෙන්වා දී තිබූ අඩුපාඩු / දෝෂ නිවැරදි කරවාගෙන නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් විගණන ඡේද වලින් පෙන්වා දී තිබූ අඩුපාඩු /දෝෂ නිවැරදි කිරීම සඳහා ගත හැකි සියළු ක්‍රියාමාර්ග ගෙන ඇති අතර තව දුරටත් පවතින අඩුපාඩු / දෝෂ නිවැරදි කර ගැනීම සඳහා බන්ධනාගාර මූලස්ථානයේ හා බන්ධනාගාර උප ආයතන වල නිළධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

ආයතනයේ නම හා ශීර්ෂය : - **ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව 326**
පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 183

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මහහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
පළමු කොටස:73.00	
ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.
2014.05.11දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පලවෙනි මුරපදය ගණකාධිකාරී හෝ අවසරලත් මාණ්ඩලික නිලධාරියෙකු පමණක් භාවිතා කර නොතිබුණි.	මේ වන විට අදාල චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු සිදු කර ඇත.
2004.05.11.දිනැති අංක 171/2004දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන සහ තෙවන මුරපද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි	චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු සිදු කරන ලෙසට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි.	ඉදිරියේදී අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී.
2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාර 2018.08.01 දිනෙන් පසුව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොමැති අතර, අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය මගින් එම කටයුතු සිදු කරනු ලබයි. අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් අභ්‍යන්තර විගණන වාර්තාවන් ඉදිරිපත් කරන අවස්ථාවේ දී අදාල පිටපත් විගණකාධිපති වෙත යොමු කරන අතර 2020 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොමැත.
මු.රෙ.134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
මු.රෙ.134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	
විගණන හා කළමණාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	2023 වර්ෂය තුල විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් කඩිනමින් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
2016.03.31 දිනැති අංක 5/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	මේ වන විට 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර විගණන අධිකාරී වෙත අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2020 වර්ෂයේ කොවිඩ් 19 රෝග ව්‍යාප්තියත් සමඟ කාර්යාල වසා තැබීමත්, නිලධාරීන් රාජකාරී සඳහා වාර්තා නොකිරීමත් හේතුවෙන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම් ප්‍රමාද වූවද,මේ වන විට භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ සියල්ලම ක්‍රියාත්මක කර අවසන් කර ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්ථා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
නියමිත දිනට බැංකු සැසඳුම පිළියෙළ කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශය මාසික පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් ගැලපුම් කළ යුතු ශේෂ මසක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කරන ලෙසත් අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මූ.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	
වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	2020.12.31 දිනට නිලධාරීන් 04 දෙනකුගේ ණය ශේෂ අය කර ගැනීමට පැවති අතර, ඒ අතරින් නිලධාරීන් 03 දෙනෙකු ස්ථාන මාරු ලද නිලධාරීන් වන බැවින් මේ වන විට එම ණය ශේෂ අය කර ගැනීම් අවසන් කර ඇත. එක් නිලධාරියෙකු සම්බන්ධයෙන් මේ වන තෙක් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බැවින් එම පරීක්ෂණය අවසන් වූ වහාම අයවිය යුතු හිඟ ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.
මූ.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්යඅතුරු අග්‍රිම කාර්ය නිම වීමාසයක් ඇතුලත නිරවුල් කර නොතිබුණි.	තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්යසාධනය පිළිබඳ

මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2020 මුදල් වර්ෂය.

කමිටුව මඟින් හඳුනාගත් දුර්වලතා / දෙනු ලැබූ නිර්දේශ	එම දුර්වලතාවයන් මඟහරවා ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය
දෙවැනි කොටස:49.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍යය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට වෙබ් අඩවියක් නිර්මාණය කර යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන අතර වෙබ් අඩවිය තුළ තොරතුරු සඳහන් කර මහජනයාට අදහස් ලබා දීමට ඉඩ සලසා ඇත.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	
2018 අප්‍රේල් 27 දිනැති අංක MSDW/08/65 දරණ චක්‍රලේඛ විධි විධාන අනුව ඉටු කළ යුතු තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා පත්කළ යුතු නියෝජිතයන් දෙදෙනා පිළිබඳව විස්තර අමාත්‍යාංශය වෙත වාර්තා කර නොතිබුණි	තිරසර සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය සඳහා මෙම දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණ නියෝජිතයන් දෙදෙනෙකු පත් කර වාර්තා කර ඇත.
පුරවැසි සේවා ප්‍රඥප්තිය නිසි පරිදි පිලියෙළ කර ක්‍රියාත්මක කර නොතිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්ති සංකල්පය දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පිළිගනිමින් දෙපාර්තමේන්තුවට ගැලපෙන සහ සුදුසු පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් මේ වන විට සකස් කරමින් පවතී.
ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමපිළිබඳ අධීක්ෂණය සහ ඇගයීම සඳහාආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් මේ වන විට සකස් කිරීමට සමගාමීව ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ද ක්‍රමවේදයක් සකස් කෙරෙමින් පවතී.
රාජ්‍ය පරිපාලන විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්ම මේ වන විට සකස් කිරීමට ක්‍රමවේදයක් සකස් කෙරෙමින් පවතී.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයක පැය 12ක අවම පුහුණුවක් නියම කර නොතිබුණි.	

සමස්ත කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.
මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය මත කාර්යාල වසා තැබීම සහ නිලධාරීන් සීමිත ප්‍රමාණයක් රාජකාරි කිරීම හේතුවෙන් වර්ෂයේ සැලසුම් කල පරිදි පුහුණු අවස්ථාවන් සිදුකිරීමට නොහැකිවී ඇත.

.....

ලේකම්

අධිකරණ බන්ධනාගාර කටයුතු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

වසන්තා පෙරේරා
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.